කොවිඩ්-19 සම්බන්ධයෙන් මාධ්‍ය විසින් වාර්තා කිරීමේදී, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති නිර්දේශයන්ට අනුකූල වනවා හා සමානවම, තමන් වාර්තාකරණය සඳහා යොදාගන්නා භාෂාව පිළිබඳව සැලකිලිමත් වීමද අත්‍යාවශ්‍ය කාරණයකි. මන්දයත්, එම භාෂාව ඔස්සේ කොවිඩ්-19 ආසාදිතයන් හා නිරෝධායනයට යොමුකරන්නන් පිළිබඳව සමාජය තුළ කොන් කිරීමේ ආකල්පයක් වර්ධනය වීමට, එය පුද්ගල ගරුත්වයට හානියක් වීමට හැකි බැවිනි.

උදාහරණයක් ලෙස, ලංකාදීප පුවත්පතේ සිරස්තලයේ සඳහන් වන 'කොරෝනා මනාලිය මනාලයා' වැනි යෙදුමක් දැක්විය හැක. මෙවන් යෙදුම් කෙතරම් දුරට සදාචාර සම්පන්න මාධ්‍යකරණය හා අනුකූල වන්නේද, මෙවන් යෙදුම් සමාජගත කිරීම කෙතරම් යෝග්‍ය වන්නේද යන පැනයන් පාඨක අප ඇසිය යුතු වේ.

එසේම එම ප්‍රවෘත්තියම මව්බිම පුවත්පත මගින්, ඉහත ආකාරයේ නිෂේධනාත්මක යෙදුම් වලින් තොරව ඉදිරිපත් කොට ඇති ආකාරයද අපට නිරීක්ෂණය කළ හැක.
**#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima #Lankadeepa**